# ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද?

# ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා

සංස්කරණය

ප්‍රදීප් පීරිස්

ඇමුණුම 1

# 'කොවිඩ්-19 හමුවේ සමාජ-ආර්ථික දර්ශකය' පිළිබඳ සමීක්ෂණය: දළ විශ්ලේෂණය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් විසින් වර්ෂ 2021 පෙබරවාරි සිට මාර්තු දක්වා පවත්වන ලද ජාතික මත විමසුමක් හරහා, ජීවනෝපායන්, සමාජ සම්බන්ධතා, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය කෙරෙහි කොවිඩ්-19 හි බලපෑම ඇගයීම සඳහා අරමුණු කර ගන්නා ලදී. මෙම පුළුල් අධ්‍යයනයේ මූලික අංගවලින් එකක් වන ප්‍රමාණාත්මක දත්ත සම්බන්ධයෙන් අදාළ තොරතුරු වලින් මෙම කොටස සමන්විත වේ.

## නියැදිය තෝරා ගැනීමේ පටිපාටිය

මෙම සමීක්ෂණය මගින් දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි පුද්ගලයන් 1000 ක් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී. දෙමළ, මුස්ලිම් සහ උඩරට දෙමළ යන ජනවාර්ගික ප්‍රජාවන්ගෙන් සහ නාගරික ප්‍රජාවෙහි ප්‍රතිචාරකයන්ගේ ක්‍රමවත් නියැදියක් හරහා ප්‍රතිචාරකයන් තෝරා ගැනීම සිදු කරන ලදී. මෙහිදී විශ්ලේෂණ කටයුතු සිදු කිරීමට පෙර, අර්ථවත් උප සමූහ විශ්ලේෂණයට ඉඩ ප්‍රස්ථාව ලබා දීම සඳහා ජාතික ජන සංයුතිය පිළිබිඹු කිරීම උදෙසා දත්ත බර තැබීමක් සිදු කර ඇත. මෙහි සමීක්ෂණ ප්‍රතිඵල +/- 2.0% ආන්තික දෝෂයකට යටත් වේ.

එක් පළාත් පාලන ආයතනයක (මහ නගර සභා, නගර සභා, සහ ප්‍රාදේශීය සභා) උපරිම වශයෙන් සම්මුඛ සාකච්ඡා 36ක් සහ එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයකට උපරිම සම්මුඛ සාකච්ඡා 6ක් වශයෙන් පවත්වන ලදී. පළාත් පාලන ආයතනය අහඹු ලෙස තෝරා ගන්නා ලදී. නියමිත ග්‍රාම නිලධාරී වසම සහ ආරම්භක ස්ථානය තෝරාගනු ලැබුවේ අදාළ ක්ෂේත්‍ර සමීක්ෂකයන් විසිනි. 'දකුණු අත රීතිය' මගින් අදාළ ගෘහය තෝරා ගන්නා ලද අතර, එහි ගෘහ මූලිකයා ප්‍රතිචාරක වශයෙන් තෝරා ගන්නා ලදී.

## ප්‍රශ්නාවලිය

පුද්ගලයන්ට සාධාරණ ලෙස සැලකීම සහ අන්තර් ප්‍රජා සම්බන්ධතා, කොවිඩ්-19 වසංගතය පිළිබඳ දැනුවත් කිරීම සහ තොරතුරු මූලාශ්‍ර, මූල්‍ය දුෂ්කරතාවන් සම්බන්ධයෙන් භාවිතා කරන ලද උපාය මාර්ග, අධ්‍යාපනයට සහ සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කරමින් කොවිඩ් අර්බුදයෙන් උද්ගත වූ තත්ත්වය පාලනය කිරීමට සම්බන්ධ විවිධ ආයතන කෙරෙහි ජනතාවගේ තෘප්තිමත්භාවයෙහි මට්ටම් පිළිබඳ මහජන මතය ග්‍රහණය කර ගැනීම සඳහා නිර්මාණය කරන ලද අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් මුහුණට මුහුණලා සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

සමීක්ෂණට අදාළ ප්‍රශ්නාවලිය මූලික වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් නිර්මාණය කර පසුව එය සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කරන ලදී. භාෂාවේ පැහැදිලි බව, ප්‍රශ්නවල අනුක්‍රමික බලපෑම සහ පිළිතුරු කාණ්ඩවල අදාළත්වය පරීක්ෂා කිරීම සඳහා, ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර පර්යේෂකයන් පිරිසක් විසින් සමීක්ෂණට අදාළ ප්‍රශ්නාවලිය සිංහල සහ දෙමළ ජනවර්ග යන් නියෝජනය කරමින් පුළුල් පරාසයකට අයත් ප්‍රතිචාරකයන් සමඟ ක්ෂේත්‍රයේදී පූර්ව පරීක්ෂාවට ලක් කෙරුණි. මෙකී පූර්ව පරීක්ෂණයෙන් පසුව සමීක්ෂණයට අදාළ ප්‍රශ්නාවලිය වැඩිදුරටත් සම්පූර්ණ කරන ලදී.

## ක්ෂේත්‍ර වැඩකටයුතු

මෙම අධ්‍යයනය සඳහා ස්ත්‍රී සහ පුරුෂ යන කාණ්ඩ ද්විත්වයම නියෝජනය කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂකයන් 71 දෙනෙකු සහභාගී විය. පර්යේෂණ කණ්ඩායම විසින් අධ්‍යයනය, සමීක්ෂණ ප්‍රශ්නාවලිය සහ ක්ෂේත්‍ර ශිල්පීය ක්‍රම පිළිබඳව ඔවුන්ට පුළුල් පුහුණුවක් ලබා දීමට පියවර ගැණුනි. ඒ ඒ ප්‍රතිචාරකගේ සහ අදාළ ක්ෂේත්‍ර සමීක්ෂකගේ මවු භාෂාවෙන් සම්මුඛ සාකච්ඡාව පවත්වන ලදී. එක්රැස් කරන ලද දත්තවල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා, ක්ෂේත්‍ර වැඩ කටයුතු සිදුවෙමින් පවතින අතරතුර සහ ඉන් අනතුරුව පිළිවෙලින් ක්ෂේත්‍ර සමීක්ෂකයන් සමඟ ක්ෂේත්‍රයේ නිරීක්ෂණ චාරිකා සිදු කිරීම් සහ පසු පරීක්ෂා කිරීම් සිදු කරන ලදී. මෙහිදී දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය වර්ෂ 2021 පෙබරවාරි සිට මාර්තු දක්වා සිදු කරන ලදී.